**ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගම - 2016/ 2017**

---

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

--------------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින්, පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) -විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති

-----------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රමිතයේ 11:21 වගන්තිය ප්‍රකාරව, ව්‍යාපෘතිවලින් ලැබිය යුතු රු.2,049,600 ක් වසර 07 ක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉන් සිදුවිය හැකි හානිකරණ අලාභය හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 17.19 වගන්තිය ප්‍රකාරව, පිරිවැය රු.38,205,552 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල, සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කමේ ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රමිතයේ 17.31(ඇ) වගන්තිය ප්‍රකාරව, එකතුව රු.19,135,797 ක් වූ දේපල පිරියත හා උපකරණවල එක් එක් පන්තිය සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ප්‍රමිතයේ 29 වගන්තිය ප්‍රකාරව, වටිනාකම රු.2,877,114 ක් වූ සමාගමේ විලම්බිත බදු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීමට හෝ ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රමිතයේ 2.52 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මගින් ඉඩ දී ඇති විටක හැර වත්කම් සහ වගකීම් සහ ආදායම් සහ වියදම් හිලව්කර දැක්වීම නොකළ යුතු වුවද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යන වැලි ව්‍යාපෘති සහ විකුණුම් මධ්‍යස්ථාන 09 ක ලාභ/අලාභ වෙන වෙනම ගණනය කිරීමකින් තොරව රු.47,583,439 ක ශුද්ධ ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---------------------------

වැලි ව්‍යාපෘතිවලින් කැණීම් කරනු ලබන වැලි කියුබ් 01 ක් සඳහා සමාගමේ ලාභ ආන්තිකය පිළිබඳ ප්‍රතිපත්තියක් ඇති කරගෙන නොතිබුණු අතර වැලි ව්‍යාපෘති සඳහා විවිධ ලාභ ආන්තික තබාගෙන තිබුණි.

**2.2.3ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මොංගිල්ලාරු වැලි ව්‍යාපෘතියේ වැලි කියුබ් 5,897 ක විකුණුම් ආදායම රු.12,090,737 ක් වුවද එය රු.11,889,359 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ආදායම රු.201,378 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අනුයුක්ත කරන ලද, සේවා කාලය වර්ෂ 05 ඉක්ම වූ සමාගමේ සේවකයන් තිදෙනෙකු සඳහා රු.106,250 ක් වූ පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) සේවය කල සම්පූර්ණ වර්ෂ ගණන සඳහා පාරිතෝෂික ගණනය කිරීම වෙනුවට සේවය කල වර්ෂ ගණනට අමතරව මාස ගණනද, පදනම්ව පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන් කිරීම රු.556,253 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) තොග ආගණනයේදී වැලි පිරවූ මළු හා හිස් මළු තොග ගණන් නොගැනීම හේතුවෙන් 28 කණුව වැලි අලෙවි මධ්‍යස්ථානයේ අවසාන තොග ශේෂය රු.278,444 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ජාතිය ගොඩනැගීමේ  බදු, ආදායමේ කොටසක් ලෙස ගිණුම් තැබීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.3,900,229 ක් වූ ආදායම් හා රු.1,092,064 ක් වූ ගෙවිය යුතු බදු අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සංශෝධිත අනුපාතය අදාළ කර නොගැනීමත්, ජාතිය ගොඩනැගීමේ බදු අයකර ගැනීමේදී ආදායම් අඩුවෙන් ගිණුම් තැබීමත් හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු  බැරකම  රු.1,377,854 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ආදායම් බදු සඳහා හිලව් කරගත නොහැකි, ඉකුත් වර්ෂවල ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු රු.262,860 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඌ) ආදායම් බදු ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනා අනුපාත සාවද්‍ය ලෙස යොදාගැනීම හේතුවෙන් ගෙවිය යුතු ආදායම් බදු රු.448,992 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) 4 වන කාර්තුව සඳහා ගණනය කරන ලද ආදායම් බදු උපචිත ආදායම් බදු වශයෙන් හා ඉදිරියට ගෙවන ලද ආදායම් බදු වශයෙන් ගිණුම්වල සටහන් කිරීම හේතුවෙන් වර්ෂය සඳහා වූ ආදායම් බදු වගකීම හා ජංගම වත්කම් රු.404,943 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.4පැහැදිලි නොකළ වෙනස්කම්**

---------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව සේවක අර්ථසාධක අරමුදල් දායකය හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය, අදාළ ලෙජර් ගිණුම් අනුව පිළිවෙලින් රු.10,536,165 ක් හා රු. 2,634,041 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම දායකය පිළිවෙලින් රු.9,555,562 ක් හා රු.2,385,932 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.981,603 ක් හා රු.248,109 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය | (i) අර්ථසාධක අරමුදල් ගණනය කිරීමේදී සේවකයන්ගේ සේවයෙන් ලැබෙන සම්පූර්ණ ඉපයීම සැලකිය යුතු වුවත් මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියේ සේවකයන් සඳහා මාසිකව කැණීම් කරනු ලබන පළමු වැලි කියුබ් 15 ට අදාළ ඉපයීම් සඳහා පමණක් අර්ථසාධක අරමුදල් ගණනය කර තිබුණි.<br><br>(ii) පනත අදාළ වන්නා වූ සේවකයෙකු විසින් රක්ෂිත වෘත්තියක වැඩ කරන කාලය තුල දායක මුදල් අරමුදලට ගෙවීමට බැඳී තිබිය යුතු වුවත් මනම්පිටිය ව්‍යාපෘතියේ වැලි කැණීම් සේවකයන්ගෙන් කොටසක් පමණක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක කරගෙන තිබුණි. එමෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අනිකුත් වැලි ව්‍යාපෘති 05 කට අනුයුක්ත සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක කරගෙන නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.2 ඡේදය | අයවැය ලේඛනය සමග අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 5.1.3 ඡේදය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අයවැය ලේඛනයේ පිටපත් අදාළ රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහාභාණ්ඩාගාරයට හා විගණකාධිපති වෙත යැවිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 16 දිනැති අංක PED 05/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීමට පෙර වර්ෂයේ ලාභය හඳුනාගත යුතු වුවද ඊට පටහැනිව 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේවය කළ දින ගණන පදනම් කර ගනිමින් සේවකයෙකුට රු. 13,500 බැගින් රු.1,263,064 ක් 2017 ජනවාරි 17 දින ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ශුද්ධ ලාභය රු.44,976,120 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.2,891,974 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.42,084,146 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ව්‍යාපෘති ආදායම රු.57,425,956 කින් හා මෙහෙයුම් නොවන ආදායම් රු.2,707,900 කින් වැඩි වී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

සමාගමේ ප්‍රධාන කාර්යය වූ වැලි කැණීම් හා අලෙවි කිරීමේ ව්‍යාපෘති හා වැලි වෙළඳපලට ඇති බලපෑම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමත්, අනෙකුත් දිස්ත්‍රික්කවල වැලි හිඟය නැති කිරීමත් අරමුණු කරගෙන 2008 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාගමට මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැණීම සඳහා අවසර ලබාදී තිබුණි. එම අධිකරණ තීන්දුවට පටහැනිව පොළොන්නරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ගනු ලැබූ තීරණයක් මත 2016 ජූලි 25 දින සිට පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිටත වැලි ප්‍රවාහනය නතර කර තිබුණි. මනම්පිටිය වැලි ව්‍යාපෘතිය යටතේ වූ වැලි සැපයුම අඩුවීම හේතුවෙන් අනිකුත් දිස්ත්‍රික්කවල වැලි හිඟයක් ඇති වී තිබූ අතර වෙළඳපල වැලි මිල ඉහල යාමට ද එය හේතුවක් වී තිබුණි.

(ii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මනම්පිටිය පාලමෙන් පහළ ප්‍රදේශයේ ගඟෙහි කිලෝමීටර් 02 ක් දුරට වැලි ඉවත් කිරීමට අවසර ලබා දී තිබුණ ද සමාගම විසින් එම ප්‍රදේශයෙන් වැලි ඉවත් නොකිරීම නිසා ගඟේ ¾ ක් පමණ විශාල වැලි තලාවකින් වැසී තිබීමෙන් සෝමාවතිය හා පොළොන්නරුව ප්‍රදේශයේ ගංවතුර ඇතිවීම පාලනය කිරීමට නොහැකි වී තිබුණි.

(iii) වැලි ව්‍යාපෘති සඳහා විශාල කම්කරුවන් සංඛ්‍යාවක් ලියාපදිංචි වී සිටියද සේවයේ නිරත වන්නේ සියයට 30 කට අඩු පිරිසක් වීම සහ අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැලි නිෂ්පාදනය අඩු වී තිබූ අතර එමගින් වෙළඳපල සැපයුම ද අවශ්‍යතාවයට හා ඉලක්කයන්ට වඩා බෙහෙවින් අඩු වී තිබුණි.

(iv) සමාගම ක්‍රියාත්මක කරනු ලබන මනම්පිටිය ඇතුළු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි ව්‍යාපෘතිවලින් නිපදවන වැලි ප්‍රමාණය අඩු වැඩි වීම හා වැලි කියුබ් එකක් සඳහා සමාගමේ පිරිවැය, සමස්ත වෙළඳපලේ වැලි මිල තීරණය වීම කෙරෙහි තීරණාත්මකව බලපා තිබුණි. ඒ අනුව වැලි කියුබ් එකක කැණීම් පිරිවැයට අමතරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මහවැලි අධිකාරිය,වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පොළොන්නරුව සංවර්ධන අරමුදල, ගංඉවුරු හා වැලි කැණීම් මාර්ග පුනරුත්ථාපනය සහ සමාජීය වගකීම් ඉටුකිරීම වෙනුවෙන් වූ විවිධ අයකිරීම් හේතුවෙන් වැලි කියුබ් එකක මිල රු.4,100 සිට රු.4,450 අතර ඉහළ මට්ටමක පැවතුන ද සමාගම මිල පාලනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(v) ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව මනම්පිටිය වැලි ව්‍යාපෘතිය මගින් කොළඹ හා අනිකුත් ප්‍රදේශවල වැලි හිඟය නැති කිරීමට අපේක්ෂා කර තිබුණද, කැණීම් කරන ලද වැලි වලින් වැඩි ප්‍රමාණයක් පොළොන්නරුව ප්‍රදේශයේ පිහිටි සමාගම් 03 ක් වෙත නිකුත් කර තිබූ අතර එම වැලි යොදාගන්නා ලද්දේ කවර කාර්යයන් සඳහාද යන තොරතුරු සමාගම සතුව නොතිබුණි.

### 4.2 අරමුණුවලට පටහැනි ගනුදෙනු

--------------------------------

සමාගම පිහිටුවීමේ අරමුණුවලට පටහැනිව රු.9,025,000 ක් වැයකර වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ 02 ක් මිලදී ගෙන තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැල්ලවාය කොටිගම්බොක්ක තිරුවානා නිධිය කැණීමේ ව්‍යාපෘතියේ කැණීම් කටයුතු විගණිත දිනය වූ 2017 ඔක්තෝබර් 31 වන විටත් ආරම්භ කර නොතිබූ අතර තිරුවානා ගබඩා කිරීම සඳහා ඉඩමක් බදු ගැනීම, පාලම් තරාදි සවි කිරීම, ආරක්ෂක කටයුතු පවත්වාගෙන යාම සහ අනිකුත් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.6,327,849 ක් වැයකර තිබුණද කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

(ආ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන වැලි ප්‍රවාහන බලපත්‍ර ලිවීමේ කටයුතු එම කාර්යාංශය විසින් සිදුකළ යුතු වුවත්, පොළොන්නරුව වැලි කැණීම් මධ්‍යස්ථානවල ප්‍රවාහන බලපත්‍ර ලිවීම සඳහා සමාගම මගින් වැටුප් ගෙවමින් සේවකයන් 16 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ඇ) අරගලන්විල වැලි කැණීම් ව්‍යාපෘතියේ කැණීම් කළ වැලි වෙනත් ස්ථානයක ගබඩා කර අලෙවිකර තිබුණද ඒ සඳහා වෙළඳ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගෙන තිබූ සේවකයන්ට ආපදා ණය හා වෙනත් අත්තිකාරම් ලබාදී තිබුණු අතර එසේ සමාගමේ සේවකයන් හා මනම්පිටිය වැලි ව්‍යාපෘති සේවකයන්ට ලබාදී තිබූ රු.1,304,500ක් වූ ආපදා ණය හා වෙනත් අත්තිකාරම් එම සේවකයන් සේවයෙන් ඉවත්ව ගොස් තිබූ බැවින් නැවත අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් මොන්ගිල්ලාරු ඔය ප්‍රතිසංස්කරණයේදී ඔයෙන් ඉවත් කරන ලද වැලි කියුබ් 20,000 ක් ඉවත් කිරීමට සමාගමට භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ පරීක්ෂණ වාර්තා අනුව වැලි තොගයේ වැලි කියුබ් 20,000 ක් අඩංගුව පැවතිය ද, විකුණුම් වාර්තා අනුව වැලි කියුබ් 5897 කට අදාළ ආදායම රු. 11,889,359 ක් පමණක් සමාගමට ලැබී තිබුණි. වටිනාකම රු.28,915,633 ක්වූ ඉතිරි වැලි කියුබ්14103 ක් ඉවත්කර තිබුණ ද ඒ සඳහා සමාගමට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ii) ඔය ප්‍රතිසංස්කරණය සිදුකල කොන්ත්‍රාත්කාර සමාගමට ඔයෙන් ඉවත්කළ වැලි අයත් නොවුනද විකුණන ලද වැලි කියුබ් 5,897 ක් වෙනුවෙන් රු.5,897,000 ක මුදලක් සමාගම විසින් අදාළ කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවා තිබුණි.

(iii) වැලි විකිණීම සඳහා සමාගම වෙත ලබාදෙන ලද වෙළඳ බලපත්‍රයේ වලංගු කාලය 2016 අප්‍රේල් 28 දිනෙන් අවසන් වී තිබුණ ද එම දිනෙන් පසුව ද වැලි කියුබ් 1,539 ක් සමාගම විසින් වලංගු බලපත්‍රයක් නොමැතිව විකුණා තිබුණි.

(ආ) පොළොන්නරුව වැලි ව්‍යාපෘතිවල වැලි අලෙවි මිල, බෙදාහැරීම, වැලි සැපයුම, ටිපර් රථ මිලදී ගැනීම, සේවක වැටුප් යනාදී කටයුතු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු වුවත්, ඊට පටහැනිව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වනු ලබන රැස්වීම්වල තීරණ මත සමාගම කටයුතු කර තිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම පිහිටුවා වසර 16 ක් ඉක්මවා තිබුණ ද, 2003 ජූනි 02 දිනැති අංක දරන PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අනුමත සංවිධාන සැලැස්ම හා බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

(ආ) සමාගම පිහිටුවීමේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව එහි කාර්ය මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී ඇතුලු නිලධාරීන් 05 - 06 ක් අතර විය යුතු වන අතර සමාගම විසින් ඉටු කරනු ලබන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගත යුතු විය. එසේ වුවද, ඊට පටහැනිව ව්‍යාපෘතිවල සේවකයන් 86 ක්ද ඇතුළුව 126 ක් වූ සමාගමේ සමස්ථ කාර්ය මණ්ඩලයම කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඇ) සමාගමේ කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීමට පළපුරුදු හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටියදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන් 07 දෙනෙකුගේ ද සේවය ලබාගෙන වර්ෂය තුළ රු.415,000 ක දීමනා ගෙවා තිබුණි.

(ඈ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අවිධිමත් ආකාරයට තෝරා එවනු ලබන පුද්ගලයන්ට සමාගම විසින් කොන්ත්‍රාත් පත්වීම් ලබාදී කාර්යාංශයේ විවිධ තනතුරුවල සේවයේ යොදවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මෙලෙස සේවකයන් 107 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

**4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

වැලි පැටවීම සඳහා 2009 වර්ෂයේදී රු.8,883,520 කට මිලදී ගත් ලෝඩර් යන්ත්‍රයක් මනම්පිටිය වැලි ව්‍යාපෘතියට යොදවා තිබුණි. 2012 වර්ෂයෙන් පසු මෙම යන්ත්‍රය වැලි පැටවීම සඳහා භාවිතයට නොගෙන වැඩබිමේ සුළු වැඩ කටයුතු සඳහා යොදවා තිබූ අතර වැලි පැටවීම සඳහා බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනමට ලෝඩර් යන්ත්‍ර ලබාගෙන තිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සමාගමේ සම්පත්**

------------------------------------------------------------

මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාල කටයුතු සඳහා යොදවා තිබූ ලිපිකරුවන් දෙදෙනෙකුට සහ කාර්යාල සහායකයන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ රු.1,095,000 ක වැටුප් සමාගම විසින් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**5.1 සංයුක්ත සැලැස්ම**

--------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

ගිණුම් වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ව්‍යාපෘති ඇතුළු සමාගමේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර විගණනයට ලක්වී නොතිබුණි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අභ්‍යන්තර විගණක සමාගමේ අභ්‍යන්තර විගණක ලෙස පත්කර තිබුණද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් කළ හැකි වන පරිදි කාර්ය මණ්ඩලයක් සහ අනෙකුත් පහසුකම් සපයා නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාගමේ අයවැය ගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා සැසඳීමේදී සියයට 11 සිට සියයට 866 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5.5 පරිසර හා සමාජ වගකීම් ඉටු කිරීම

වැලිකන්ද වැලි කැණීම් ව්‍යාපෘතිය යටතේ වැලි කැණීම් සිදුකරන මාදුරු ඔයෙහි ස්ථාන කිහිපයක ගංඉවුරු විශාල ලෙස සෝදා පාළුවට ලක්ව ගස් කඩා වැටී තිබීම හේතුවෙන් එම ස්ථානවල වැලි ගොඩ දැමීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නියමයෙන් නවතා දමා තිබුණි. එසේ වුවද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් දැනුම් දුන් පරිදි හානි වූ ගං ඉවුරු පුනරුත්ථාපනය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

# 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (i) වාහන පාලනය | වාහන ධාවන සටහන් නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ii) මානව සම්පත් කළමනාකරණය | (අ) මානව සම්පත් සැලැස්ම, බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටි කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| | (ආ) ප්‍රාදේශීය මධ්‍යස්ථානවල රාජකාරී පැවරුම්, පැමිණීම් පිටවීම්, බැහැර යාම් හා කෙටි නිවාඩු ලේඛන පවත්වා ගැනීම නිසි පරිදි ඉටු කර නොතිබීම. |
| (iii)වත්කම් පාලනය | ප්‍රාදේශීය මධ්‍යස්ථානවල වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (iv) මූල්‍ය පාලනය | (අ) චෙක්පත් මගින් සිදුකල යුතු ගෙවීම් සුළු මුදලින් ගෙවා තිබීම. |
| | (ආ) ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් එක් රැස් කර ගනු ලබන මුදල් ආරක්ෂිතව තබා ගැනීමට හා අප්‍රමාදව බැංකුගත කිරීමට කටයුතු නොකිරීම. |